Tamils in France ignore LTTE's mourning call

Tamils in France ignored the three day mourning period declared by the LTTE to mark respect to former political chief S P Thamilselvan who was killed in an air strike last Friday. Over 100,000 strong Tamil community in France went about their normal businesses and social activities not bothering at all about the morning call.

This correspondent who visited La Chapelle, the nerve centre of Tamils in Paris saw that all the restaurants in the area were full of boisterous Tamil families partying during the weekend. Although most of the Tamil shops, groceries and restaurants displayed coulour ed photographs and long appreciations prominently pasted on front doors and walls, hardly anybody stopped to read. The people glanced at them with visible indifference and went on with their work.

කවි කොළය

අරාබි සමයං

අරාබි රටකදි දාගෙන ගෝරි
ලංකාවට ආ නුලෙන් බේරි
අවුරුදු හතළිහෙ මේ සුකු මාරි
අළුතින් ගෙදරට ආ මෙහෙ කාරි

උදේට ගුඩ් මෝනිං යයි කියලා
බෙඩ් ටී එක යයි ඇඳ ළඟ තියලා
ඈ නැත හොදි බත් කිසි දා උයලා
බාබ ට දුන්නලු ඔටු මස් බැදලා

ඔටුමස් කන්නට බැරිවිය කල කින්
කියමින් පසුවෙයි ඈ දොල දුක කින්
සමහර විට සැරසී කලිසම කින්
නැලවිලි ගමනින් යන හැටි නොදකින්

'කම් කම්' කියලා අමතයි බල්ලා
පැනයයි ඌ කස්තිරමක් අල්ලා
'ගෙටවුට්' කී විට වලිගය හොල්ලා
ළඟටම එයි ඒ සුනඛ මහල්ලා

එයාගෙ ගෙදරත් බල්ලෙක් ඉන්නේ
ඉංග්‍රිසි මිස නැහැ සිංහල දන්නේ
සුද්දෙකුගේ ගෙදරලු ඌ උන්නේ
ඉංග්‍රිසි බාසාවෙන්ලු බුරන්නේ

බාබා ඇවිදින් ඇයට විටින් විට
කසයෙන් තැලු හැටි පිට පුපුරන් නට
හැට්ටය ගලවා ගොස් පෙන්නන් නට
නැග්ගා නහුතෙට මගේ බිරින් දැට

දාගෙන කොටුවක් එළුවන් හරකුන්
ඈ ඇති කෙරුවලු එහේදි කළුකුන්
දැකලාවත් නැහැ ගොටුකොළ කංකුන්
බබෙක් වෙන්න ඈ දඟළයි උක්කුං

පිට කවුරුත් ආවොත් අත දෙනවා
'කම් කම් සිට්' යයි ගෙට අමතනවා
ගුඩ් මෝනිං යයි රෑත් කියනවා
පුටු සෙට් එක උඩ දවල් නිදනවා

දවසම රියැදුරු
එක්කයි ගෝරි
ඉන්නට බැහැ
යකෙකුටවත් බේරි
ගසමින් ලෝකය
වටේ සවාරි
මෙහාට විත් මේ
සමයං කාරි



♦ **තලන්ගම ජයසිංහ**
Sri Lanka

කිව්වරයා ගැනයි මේ.....

ලංකා විත්ති පුවත්පතට නිතිපතා ඉහත කවිකොළය ලියන තලංගම ජයසිංහ කිව්වරයාණන් ගැන පාඨක ඔබ විමසා තිබූ නිසාය මේ කෙටි සටහන. ජයසිංහ මහතා ශ්‍රී ලංකාවේ අද සිටින චිත්‍රශිල්පීන් අතුරෙන් ප්‍රවීනතම සිත්තරා වෙයි. වසර ගණනාවක් තිස්සේ ලේක්හවුස් ආයතනයේ ප්‍රධාන චිත්‍රශිල්පී තනතුර දැරූ ඒ මහතා මධුර චිත්‍රකතා පත්‍රයේ කතුවරයාද විය. චිත්‍රශිල්පයට මෙන්ම කවියට හා ලේඛනයට ද එකසේ දක්ෂය. එම හැකියා ත්‍රිත්වය ඇති තවත් කෙනෙකු අද දවසේ ශ්‍රී ලංකාවේ නැති බව කිව යුතු ය.

අංක භාවිතයේ උපත

ගණන් කිරීම සහ ඊට සුදුසු අංක භාවිතය කවදා ආරම්භවුනාද යන්න සැබැවින්ම කිසිවෙක් නොදනී. ගණිත ඉතිහාසඥයෝ මේ පිළිබඳව තවමත් පර්යේෂණ පවත්වති. එහෙත් ගණිතය වසර දහස් ගණනකට පෙර මානව ශිෂ්ඨාචාරයේ මුල් යුගයේම පටන්ගත් බව පිළිගනිති. මුල් අවධියේ ඉතා විශාල සංඛ්‍යාවන්ගෙන් අපේ මුතුන් මිත්තන්ට වැඩක් නොවී ය. ආදි කල්පිකයා දඩයම් යුගයෙන් එඩේර යුගයට පිවිසුනාට පසු තමන් හීලෑකර ගත් බැටළුවන්, ගවයන් ආදී සතුන් කොපමණ සිටීදැයි මතක තබාගන්නට තරමක් විශාල සංඛ්‍යාවන් අවශ්‍ය විය. එයට හේතුව තමන්ගේ සතුන් පලා ගොස් හෝ කිසිවෙකු සොරාගෙන ඇති බව හෝ තේරුම් ගැනීමට ය. සමූහ වශයෙන් සතුන් ගණන් කිරීම වඩාත් පහසු බව ඔවුහු තේරුම් ගත්හ. 5 සහ 10 ඔවුනට වැදගත්විය. අත් දෙකේ ඇඟිලි 5 බැගින් තිබීම ගණන් කිරීම සඳහා ඉවහල් විණ. එය වඩා පහසු ක්‍රමය විය. අපේ ආදි මුතුන් මිත්තෝ සහ දෙපා යන ක්‍රමය තවමත් ප්‍රයෝජනයට ගන්නා ගෝත්‍රිකයින් දකුණු ඇමරිකානු රටවල සිටින බව අසන්නට ලැබේ. තවද බයිබලයේ සඳහන් මේ වගන්තිය ඔබ අසා ඇත. "Human life is limited to three scores 20 plus 10" (මිනිස් දිවියෙහි කාලය තුන් විසි අවුරුදු සහ තවත් දහයකි යනුවෙනි) මෙය බයිබලයට ඇතුළුවූයේ ඉහත සඳහන් කරුණ නිසා විය හැකි බව ක්‍රිස්තියානි දේවධර්මාචාර්‍යවරු (Theologists) සලකති.

ක්‍රමයෙන් මිනිසා සතු දේපළ වර්ධනය වෙත්ම ගණන් කිරීමද වැඩි දියුණු කරගැන්මට අවශ්‍ය විය. එපමණක්ද නොව ගණිත දැ සටහන් කර තැබීම ද අවශ්‍ය විය. ඒ යුගයේ ලිවීම පටන්ගෙන නොතිබුණු නිසා ඊට යම් ක්‍රම සහ විධි ඔවිහු සොයා ගත්හ. එනම් ලීයක කොත්තු හෙවත් කට්ට කැපීම, වැලක ගැට ගැසීම හෝ බොරලු ගල් ගණන් කර පේලියට තැබීම ඒ සමහරකි.

මෙයින් සෑහීමට පත් නොවූ

සතුන් ගණන් කිරීම අවශ්‍ය වූ නිසා නිසා අංක භාවිතය ලොව ඇතිවිය

මෙකල ළමයින් මෙන් අත් ඇඟිලි ගණිමින් ගණිතයට පුරුදු වූහ. එම නිසාම 5, 10, 15, 20 හෝ 60 වැනි සංඛ්‍යාවන් පහෙන් පටන් ගෙන ගුණ කිරීම ඉගෙන ගත්හ. මෙයම පසුව ඉතා වටින ගණිත ක්‍රමයක් වූ අතර ඔවුන් ප්‍රගුණ කළ තවත් ක්‍රමයක් සකස් වූයේ 2 සහ 4 ඉලක්කම මුල් කරගෙන ය. එයට හේතුව අපට පා දෙකක් සහ අත් දෙකක් තිබීම ය.

5 එක අතක්, 10 අත් දෙකක්, 15 අත් දෙක සහ එක පයක්, 20 දෑත් ඒ ආදිකල්පිකයෝ ගණන් සටහන් කිරීමට විශේෂ සළකුණු සොයාගත් තෝය. එම සළකුණු වලට වැඩිදෙන කැමති වූ පසු ඒ සළකුණු ප්‍රයෝජනයට ගෙන විශාල ගණන් සටහන්කර ගැන්මට ඔවුනට පුළුවන් විය.

අද 10 මුල්කර ගත් ගණිත ක්‍රමයක් අපට තිබේ. උදාහරණයක් වශයෙන් 15 සටහන් වන්නේ 1 5 වශයෙන් නොව, 10 5 යනුවෙනි.

කාලයාගේ ඇවැමෙන් මිනිසා තවත් ඉදිරියට යමින් එඩේර යුගයෙන් ගොවි යුගයටද, එතැනින් වෙළඳ යුගයටද අවතීර්ණ විය. එවිට ඔහුට අසල් වැසියන් සමග මෙන්ම පිටස් තරයින් සමගද ගනු දෙනු කරන්නට සිදුවුණි. මෙහි දී ගණිත සටහන් ක්‍රමය ඔහුට මහත්සේ උපකාරී විය. තව තවත් විශාල සංඛ්‍යාවන් පරිහරණය වන වෙනස් ගණිත ක්‍රමද ඒ මගින් සොයාගැන්මට ඔහුට හැකිවිය.

ඒ පැරණි ගණන් ක්‍රම පරිණාමය වී අද පවතින ගණිත ක්‍රමයට එන්නට වසර දහස් ගණනක් ගතවී තිබේ. අප අද භාවිතා කරන දශම ක්‍රමයට අපි ඒ පැරණි මුතුන්මිත්තන්ට ණයගැතිවෙමු. එපමණක් ද නොව ගණිතය විද්‍යාවක් ලෙස ක්‍රමානුකූලව දියුණුකර ගැන්මට අවශ්‍ය හෝඩුවාවන් ඔවිහු අපට තබා ගියහ.

අප භාවිතා කරන ගණිත ක්‍රමවල පරිණාමය හැදෑරීම කුඩා කල සිටම මගේ සිත්ගත් දෙයක් විය. පාඨක ඔබටද එසේ හැඟෙන්නට ඇතැයි මම සිතමි.

♦ ***මහාචාර්‍ය සම්පත් ඇන්සන් ප්‍රනාන්දු***
Essex UK

ඉරිදා SUN - අනුරාධපුරේ ගුවන් හමුදා කඳවුරට කොටි ගහලා අහස්යාත්‍රා අටක් විනාස කරලා. පාඩුව රුපියල් කොටි ගණනක්. දැන් තමයි හොයන්නෙ කොහොමද මුන් ඇතුල් වුණේ කියලා. හමුදා යුනිපෝම් ඇඳලා හන්ද අපේම කස්ටිය කියලා හිතල ඇතුළට ගත්ත කියලා කියනවා. තව කස්ටියක් කියනවා අටමස්ථානෙ වන්දනා කරන්න නුවර ඉඳලා එන වන්දනා නඩයක් හැටියටලු කොටි ආවෙ. ඒ ගමන් මේ කැම්ප් එක බලන්න ආසය කිව්වම, එන්න උපාසකමහත්වරු,එන්න උපාසක අම්මෙ කියලා මරාගෙන මැරෙන කොටි ටික කැම්ප් එක ඇතුළට ගත්තලු. මේ සේරම බොරු කතා වෙන්න පුළුවන්. ඒත් සිංහල හමුදාවන්ගෙ කනෙන් රිංගල ගිහිල්ලා ඒ විනාසෙ කරපු බව නම් ඇත්ත. ලැජ්ජෑවෙ බෑ. ගොනාට අන්දන්න ලේසි බව හුඟක් වතාවල ඔප්පු වෙලා තියෙනවා.

සඳුදා MON - ලන්ඩන් නගරාධිපතිකමට ලංකාවෙ තරුණ අහපු අපේ සිංහල කස්ටිය පස්වනක් ප්‍රීතියෙන් පිනා ගිහිල්ලා, " ඔබට ජයවේවා! ඔබ අපේ රටට දැයට විසාල ආඩම්බරයක්! ඔබ ලක්මෑණිගෙ සැබෑ සිංහල දුවෙක්! " ඔය ආදී ප්‍රශංසා එපැයි නොකියන්න දෙන්න පටන්ගත්තා. ඒක අහල ඒ ගෑණු ළමයා ඊමේල් එකක් එවනවා මේ විදියට. " ආදරණීය තමුසෙලා වෙතටයි.... තමුසෙලාට වල්ගෙ පැගිලා වගෙයි.... මම ශ්‍රී ලන්කන් නෙවෙයි...මම බ්‍රිටිෂ් හලෝ..." අර සැලියුට් ගහපු කස්ටිය අකඳකඳකොරොස් වෙලා ගියා. කට පියාගත්තා. දැන් කිසි සද්දයක් නෑ. ඔන්න කනෝ පිණුම් කිව්වලු.

කුජදා TUE - තමිල් වෙල්වම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් දීපු ප්‍රහාරයකදි වැලිගම ගියයි කියන ආරංචිය මෙහේ බීබීසී නිව්ස්වලට කියපු වෙලාවෙම කිරිබත්ගොඩ ඉඳන් කැතරීන් කුඩම්ම කතාකළා එතන කෝල් සෙන්ටර් එකකින්. කුඩම්මගෙ කතාවට වැඩිය ඇහුණෙ අල්ලපු කෙහෙල් ගෙඩි කඩේ මුදලාලි කාටද බනින සද්දෙ. කුඩම්ම කියනවා තමිල් වෙල්වම් මැරුණ එක ගැන ප්‍රභාකරන්ටත් වැඩිය දුක්වෙන්නෙ කොළඹ සිංහල සාම වෙළෙන්දොලු. උන් දැනටම ශෝක ප්‍රකාශයක් ගහල බෙදනවලු. ඒකෙ ලියලා තියනවලු " මුඩුම මූසල කොටි මුණු අතර තිබුණු පොල් කැල්ල වැනි ඔබගේ සුන්දර හිනාව යළි අපි කවදා දැකගන්නද?" කියලා. කොළේ බෙද බෙද මැනුත් ඉකි ගගහ අඩනවලු. හරි වැඩේ.

බුදදා WED- මෙහේ ඉන්න අපේ බොහොම දෙනෙක් ලංකාවට ගිහිං ඉඩමක් අරගෙන ගෙයක් හදනවා නැතිබැරි කාලෙක ගිහිං වැටිලා ඉන්න පුළුවන් කියලා. ඒක ඉතින් හොඳ වැඩක් තමයි. ලන්ඩන් වලින් අළුත් අළුත් මෝස්තරවල, ඒවගේම ඉතාම ගණන් භාණ්ඩ, ලයිට් වර්ග, කර්ටන්, දොර රෙදි එහෙම අරං ගිහින් දානවා. මෙහෙන් මල්පැලත් ගෙනිහින් හිටවනවා. සැටල්ලයිට් ටෙලිවිෂන් ගන්නවා. මැස්සෙකුටවත් වහන්න බැරිවෙන විදියේ එලාම් සිස්ටම් හයිකරනවා. ඒපාර ඒගෙදර පොටෝ ගෙනැත් මෙහේ ඉන්න අයට පෙන්නනවා. ඔයාලා හරි ලකී අනේ කියලා ඒ පොටෝ බලල සම-හරු කියනවා. එහෙම කියන කොට ඉතින් හරි අගේ.

බ්‍රහස්පති THU - ටික කාලයක් යනකොට ලංකාවෙ ගෙවල් හදපු කස්ටිය මෙහේ ඉඳන් ලතවෙනව. වැස්සට බිත්ති ටික තෙමෙනවද දන්නෙ නැහැ. ජනෙල් ටික කවුරු හරි ගලවං ගිහිංද දන්නෙ නැහැ. අනේ මිදුලෙ තිබ්බිච්ච මල් පැල ටික දැන් නැතුව ඇති. එනකොට බාත්රූම් එකේ පිටිපස්සෙ ජනේලෙ බිඳිලා තිබුණා, ඒකෙන් තලගොයි ගෙට රිංගුවද දන්නෙ නැහැ. වහලෙ ඒරියල් එක ගලවං ගිහිල්ලා ඇති. දැන් එහෙම හිතන කොට රෑට නින්ද යන්නෙ නැහැ. නින්ද ගියත් හීනෙන් දකිනවා කවුද ගෙයි දොර ඇරගෙන ඇතුළට යනවා. බයවෙලා ගැස්සිලා ඇහැ ඇරෙනවා. ඒපාර කිට්ටුව පහත අදුරන කෙනෙකුට ටෙලිපෝන් කරල කියනවා ගිහිල්ලා ගේ ටිකක් බලන්න කියලා.මොන ජීවිතයක්ද?

කිවිදා FRI - මේ ළඟදි මම දැක්කා ආරක්ෂක ලේකම් ලීඩර් පත්තරේට නඩුවක් දාලා මිලියන දහයක් ඉල්ලලා. ගිය අවුරුද්දෙ ජනාධිපතිවරයා ලංකාදීපෙ කර්තෘට විරුද්ධව මිලියන ගණනක නඩුවක් දාලා තිබුණා. කාටවත් පැහැදිලි නැති කාරනේ තමයි ඔය පත්තර කර්තෘලා ළඟ ගෙවන්න ඔය හැටි සල්ලි තියනවද? පත්තරකාරයො දුප්පත් මිනිස්සු. රුපියල් සීයක් දෙසී යක් නම් ගෙවාවි. කොහේ තියන මිලියන ගණන්ද? ඔය දාන මිලියන ගණන් වන්දි කවදාවත් ගෙවලා තියනවද? අපි නම් අහලා නැහැ. ළඟදි ලංකාව ලෝක බැංකුවෙන් ණයක් ඉල්ලුවම ඒකෙ ලොක්කො කිව්වලු උඹලයි රටේ ඔච්චර සල්ලි තියෙද්දි ඇයි අපෙන් ණය ඉල්ලන්නෙ, අපි දැක්කා මිලියන ගණන් වල වන්දි නඩු කියලා. සල්ලි ඉල්ලන්න ගිය කෙනා කිව්වලු ඔය නිකං බය කරන්න දාන නඩු. දැන් කාලෙ මිලියන වලින් නඩු දැම්මෙ නැත්නම් අපේ තත්වෙට මදිනේ කියලා.